# 1.11 නූතන හින්දී කෙටිකතාවල නිරූපිත කාන්තාව පිළිබඳ විමර්ශනයක් (හින්දී ලේඛිකා ශිවානිගේ කෙටිකතා ඇසුරෙනි)

අනූෂා සල්වතුර
හින්දී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

නිදහසට පසු හින්දී කෙටිකතා සාහිත්‍යයේ ප්‍රාදේශී කෙටිකතා ලේඛිකාවක ලෙස ගෞරවයට පාත්‍ර වූ 'ශිවානී ගෝරා පන්ත්' භාරතීය කඳුකර සමාජය, සංස්කෘතිය පසුබිම් කරගනිමින් කාන්තාවන්ගේ හැසිරීම්, මනෝ ආවේගයන් මෙන් ම සමාජයෙන් කාන්තාවට එල්ල වන නොයෙක් ආකාරයේ හිරිහැර සහ කාන්තාවන්ගෙන් සමාජගත පුද්ගලයන්ට මුහුණ දෙන්නට සිදුවන නොයෙකුත් අපහසුතාවන් ආදි විෂයයන් තම කෙටිකතාකරණයට පාදක කොටගත් ලේඛිකාවකි.

බහුතරයක් ලේඛිකාවන්ගේ නිර්මාණකරණයට වස්තුවිෂය වන 'කාන්තා නිදහස' වෙනුවට ඇය වස්තුවිෂය කොටගන්නේ කාන්තාවන්ගේ අතිසූක්ෂ්ම චරිත ලක්ෂණයන් ය. තමාට ම ආවේණික ශෛලියකින් කෙටිකතාකරණයෙහි යෙදෙන ඇය, තම කෙටිකතා අතරින් වැඩි ප්‍රතිශතයක 'ශිවානී' නමින් ම පෙනී සිටිමින් එහි සෑම චරිතයක් ම සජීවී චරිත බවට පත් කිරීමට උත්සාහ දරයි.

ශිවානිගේ කෙටිකතාවලට වස්තුවිෂය වන කාන්තාව විටෙක ඇයගේ පාසැල් අවධියෙහි මිතුරියකි, විටෙක ඥාතිවරියකි, තවත් විටෙක ඇයට තම ජීවන ගමන් මගෙහි හමු වූ අමුත්තියකි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇයගේ කෙටිකතාවල ඉදිරිපත් වන කතාවස්තුන්හි බොහෝ විට කල්පිතයකට වඩා යථාරූපී බවක් දක්නට ලැබීම ද විශේෂත්වයකි. ඒ නිසා ම ඒ කෙටිකතාවලට වස්තුවිෂය වන ඇය විසින් නිරූපිත කාන්තාව පෙරදිග සමාජයේ, අපට එදිනෙදා හමුවන ගෘහණියක, පෙම්වතියක සහ දුවණියක ලෙස හැඟෙයි.

ඒ අනුව නූතන හින්දී කෙටිකතා සාහිත්‍යයේ සුවිශේෂී ලේඛිකාවක වන ශිවානිගේ කෙටිකතාවල නිරූපිත කාන්තාවන්ගේ විශේෂ චරිත ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කිරීම සහ ඒ තුළින් ඉදිරිපත් කරන්නට උත්සාහ දරන 'කාන්තා ප්‍රතිරූපය' කුමක් ද යන්න විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.